1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/06/04/2024(60) | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.07.25 |


ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2024

2024 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2023.12.01 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 03/2023 හා බැඳේ.

02. ඒ අනුව, 2024 වාර්ෂික ස්ථාන මාරු ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ නිකුත් කිරීමෙන් අනතුරුව, උක්ත චක්‍රලේඛයේ 09 වගන්තිය ප්‍රකාරව තවදුරටත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන්ට අදාළව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභියාචනා තීරණ නිකුත් කරන ලද අංක SP-PSC/5/1/2A-3(I) හා 2024.07.25 දිනැති ලිපිය මේ සමඟ ඇමුණුම් කර ඇති අතර, එම තීරණ ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) හා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියට (www.pcs.sp.gov.lk) මුදා හැර ඇති බව කාරුණිකව දන්වමි.

- ඇමුණුම 01 - සංවර්ධන නිලධාරි සේවයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ
- ඇමුණුම 02 - කළමනාකරණ සේවා නිලධාරි සේවයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ
- ඇමුණුම 03 - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ.
- ඇමුණුම 04 - රියදුරු සේවයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
- තීරණ.
- ඇමුණුම 05 - කාර්යාල සේවක සේවයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ.
- ඇමුණුම 06 - ඉහත සියළු තනතුරුවලට අදාළව ආයතන ප්‍රධානීන්ගේ ඉල්ලීම් සම්බන්ධ තීරණ.
- ඇමුණුම 07 - ස්ථාන මාරු නොලද නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධ තීරණ.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052 | ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

03. ඒ අනුව උක්ත යොමු ලිපියේ 2 ඡේදය ප්‍රකාරව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි උක්ත වාර්ෂික ස්ථාන මාරු නියෝග 2024.07.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2024.07.26 දින සේවයෙන් පසු (27 හා 28 දෙදින සෙනසුරාදා හා ඉරිදා දින බැවින් ) අදාළ නිලධාරින් නිදහස් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ හා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ යටතේ වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය දීර්ඝ කරන ලද නිලධාරින්ගේ ස්ථාන මාරු **එසේ දීර්ඝ කරන ලද දිනයේදී** සිදු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. අංක 03/2023 දරණ ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛයේ 18 වගන්තිය ප්‍රකාරව ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන්ගේ ස්ථාන මාරු **ප්‍රසූත නිවාඩු අවසන් කර පැමිණ සතියකට පසුව ක්‍රියාත්මක කල යුතුය**. තවද, එම නිලධාරින්ගේ ප්‍රසූත නිවාඩු අවසන් වන දිනය සම්බන්ධව එම ස්ථාන මාරු ගැලපුමට අදාළ නිලධාරින්ගේ ආයතන ප්‍රධානින් වෙත කල්වේලා ඇතිව දැනුම් දීම ආයතන ප්‍රධානින්ගේ වගකීමක් වන බවද දන්වා සිටිමි.

06. ඒ අනුව, ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා නොගත යුතු අතර, අනුප්‍රාප්තික නිලධාරින් පැමිණෙන තෙක් ඔවුන් රඳවා නොගෙන නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

07. එකී ස්ථාන මාරු වී යන නිලධාරින්ගේ රාජකාරි ආයතන ප්‍රධානියා හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් නම් කරන නිලධාරියෙකුට භාර දී, නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අදාළ නිලධාරීන් සේවයෙන් නිදහස් කිරීම ඔබගේ වගකීම වන බව අවධාරණය කරන අතර, **නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද දන්වමි**.

08. එමෙන්ම, නියමිත දිනයේදී ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොකිරීම මත ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව වගකිව යුතු බව මින් අවධාරණය කරන අතර, **නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන්ගේ වැටුප් හා සියලු දීමනා ගෙවීම නතර කිරීමට පියවර ගන්නා ලෙස ද මින් නියෝග කරමි.**

09. එසේම, මා විසින් නිකුත් කරන ලද අංක 03/2023 හා 2023.12.01 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, මෙම 2024 වාර්ෂික ස්ථාන මාරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණවල මුද්‍රිත පිටපත් දකුණු පළාත් සභාවේ සියලු ආයතන වෙත යොමු නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

10. එබැවින්, ඔබ අමාත්‍යාංශයට/දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත ද 2024 වාර්ෂික ස්ථාන මාරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා අභියාචනා තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**සුමිත් අලහකෝන්**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**

පිටපත් :

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය - දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය -2024 වාර්ෂික ස්ථාන මාරුවීම්වල ප්‍රගතිය මසක් ඇතුළත මා වෙත දැනුම් දීමට